# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2131/20 - 2019 ජූලි මස 09 වැනි අඟහරුවාදා - 2019.07.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වන වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවී කරුණානායක වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රවී කරුණානායක,
විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019 ජුනි මස 27 වැනි දින.

**උපලේඛනය**

ශ්‍රී ලංකාද්වීපයේ දකුණු පළාතේ, මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 262 A දරන වැලිව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වැලිව ග්‍රාමයේ පිහිටි මොරවක කෝරලේ රජයේ වරලත් මිනින්දෝරුවරයකු විසින් පිළියෙල කරන ලද පිඹුර නො. 1065 දරන 2019.05.14 දිනැති සැලැස්මෙහි ලොට් එක (1) හා ලොට් දෙක (2) වශයෙන් දැක්වෙන පහත සඳහන් පරිදි මායිම් සහිත ප්‍රමාණයෙන් පර්චස් 25.5 ක් වූ ඉඩම්.

ලොට් අංක 01

*උතුරට* : ප්‍රාදේශීය සභා පාර, මෙම සැලැස්මේ ලොට් අංක 2 ලෙස යොදා ඇති ඉඩම සහ ජී. ඒ. ප්‍රියංකර යන අයට අයත් මෙම ඉඩම අයත් ප්‍රධාන ඉඩමේ ඉතිරි කොටස

*නැගෙනහිරට* : ජී. ඒ. ප්‍රියංකර යන අයට අයත් මෙම ඉඩම අයත් ප්‍රධාන ඉඩමේ ඉතිරි කොටස

*දකුණට* : නියර

*බටහිරට* : නියර.

*හිමිකම් කියන අය* : ජී. ඒ. ප්‍රියංකර

ලොට් අංක 02

*උතුරට* : ප්‍රාදේශීය සභා පාර, සහ ජී. ඒ. ප්‍රියංකර යන අයට අයත් මෙම ඉඩම අයත් ප්‍රධාන ඉඩමේ ඉතිරි කොටස

*නැගෙනහිරට* : ජී. ඒ. ප්‍රියංකර යන අයට අයත් මෙම ඉඩම අයත් ප්‍රධාන ඉඩමේ ඉතිරි කොටස

*දකුණට* : මෙම සැලැස්මේ ලොට් අංක 1 ලෙස යොදා ඇති ඉඩම

*බටහිරට* : ප්‍රාදේශීය සභා පාර.

*හිමිකම් කියන අය* : ජී. ඒ. ප්‍රියංකර

07 - 785


1A - G 30483 — 27 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*